**පලාගල ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 12 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 12 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පානීය ජල ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදිකර තිබුණු රු.1,335,843 ක් වටිනා ජල ටැංකිය හා පැති බැම්ම ඉදිකිරීමේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | පිලිගනිමි ඉදිරියේදී හෙලිදරව් කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත ණය හිමි වටිනාකම් තුල 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.869,950 ක ඉටුනොකළ ව්‍යාපෘති සඳහා ගෙවීය යුතු ශේෂ දක්වා තිබුණි. | මෙම ශේෂ නිවැරදි කිරිමට කටයුතු කල යුතු වේ. | ඉදිරියේදි නිරවුල් කිරිමට කටයුතු කරමි. |
| (iii) | වාහන නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගන්නා ලද රු.128,100 ක් වටිනා යන්ත්‍ර උපකරණ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි | වත්කම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | පිලිගනිමි ඉදිරියේදි එය ස්ථාවර වත්කම් ලෙස ඇතුලත් කිරිමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සේවක ඇප තැන්පත් රු.81,708 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | සේවක ඇප තැන්පත් සහ වගකීම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කිරිමක් කල යුතු වේ. | සේවක ඇප තැන්පත් සේවකයාගේ වත්කමක් වන අතර එය ප්‍රාදේශීය සභාවට අයත් වත්කම් හෝ වගකීමක් නොවන බැවින් ප්‍රාදේශීය සභාවේ ගිණුම් තුළ ඇතුලත් කිරීමට කටයුතු නොකරන ලදි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේදී මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා පස්තලන යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.63,600 මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මෝටර් ග්‍රේඩර් හා පස්තලන යන්ත්‍රය කුලියට දිමෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනිමට ලිපි මගින් දැනුවත් කලත් එය අය වී නොමැති අතර ඉදිරියෙදි අයකර ගැනිමට කටයුතු යොදමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.61,257,990 ක් වූ ගිණුම් විෂයයකට අදාලව අයිතිය තහවුරු කරන ලියකියවිලි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

1.4 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම

----------------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවූ අවස්ථා පහත දක්වේ.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකුල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ). 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ධාවන මට්ටමේ පවතින වාහන 15ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහනය | චක්‍රලේඛයට අනුව කටයුතු කලයුතු වේ. | සභාවට අයත් වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරික්ෂාවක් ඉදිරියේ දී සිදු කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | | |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කලයුතු වේ. | පැමිණීමේ හා පිටවීම සම්බන්ධව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකිරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/2 භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් චක්‍රලේඛය අනුව පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කලයුතු වේ. | පරිගණක සම්බන්ධ ලේඛනයක් නඩත්තු කරගෙන යනු ලබන අතර එය චක්‍ර ලේඛ අනුව ක්‍රමවත්ව නැවත සකස් කිරීමට කටුයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.5,870,343 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.8,466,979 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,180,000 | 1,439,560 | 1,439,560 | 67,600 | 1,002,000 | 1,187,026 | 1,187,026 | 67,600 |
| කුලී | 2,192,000 | 1,750,830 | 1,880,496 | 63,600 | 1,933,000 | 1,659,825 | 1,564,159 | 193,266 |
| බලපත්‍ර ගාස්තු | 310,500 | 342,430 | 342,430 | - | 400,500 | 284,303 | 284,303 | - |
| වෙනත් ආදායම් | 6,902,300 | 8,836,092 | 15,592,296 | 9,245,012 | 4,802,300 | 10,756,639 | 3,434,977 | 16,001,216 |
| එකතුව | 10,584,800 | 12,368,912 | 19,254,782 | 9,376,212 | 8,137,800 | 13,887,793 | 6,470,465 | 16,262,082 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ සිට පැවති හිඟහිටි බදු කුලී රු.67,600 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි බදු කුලී අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | මෙම හිඟ බදු කුලී මුදල් පැරණි හිඟ ශේෂ වන අතර ඉදිරියේ දි එම ශේෂ නිරවුල් කිරිමට කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.8,237,682 ක් හා මුද්දර ගාස්තු රු.1,007,330 ක් විය. | මුද්දර ගාස්තු උසාවි දඩ නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතු වේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු සියල්ල අය කර ගැනීමට කටයුතු කර ඇත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු සිදුකල යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රැස් කළ කසල හිඟුරුවැල්පිටිය ප්‍රදේශයේ මහවැලි ඉඩමකට හා බලලුවැව රක්ෂිතයේ පිහිටි භූමියට වර්ග කිරීමකින් තොරව බැහැර කර තිබුණි. | 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතට අනුව කටයුතු කල යුතු වේ. | බල ප්‍රදේශයට අයත් කැළි කසල හිගුරුවල්පිටිය හා බලලුවැව යන ස්ථානවලට බැහැර කරන අතර එය වර්ග කිරීමකින් බැහැර කිරීමට කටයුතු යොදමි. |

(ඇ) පරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ප්ලාස්ටික් අඩංගු කසල එළිමහනේ පිළිස්සීම නොකළ යුතු වුවත් සභාව විසින් එකතුවන සියළුම කසල ස්ථාන දෙකකදී වරින්වර පිළිස්සීම සිදුකර තිබුණි. | අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව කටයුතු කළ යුතු වේ. | ප්ලාස්ටික් ද්‍රව්‍ය කසල කළමනාකරන ව්‍යාපෘතියක් තුළින් අවම කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | මෙම අරමුණු හා ඉලක්ක හදුනාගෙන එය ක්‍රියාත්මක කිරීමට චක්‍රලේඛ උපදෙස් අනුව අවශ්‍ය පියවර ගැනීම කල යුතු වේ. | එත්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු වලින් පරිසරය සුරැකිම සෞඛ්‍ය හා සනීපරක්ෂාව වැඩි දියුනු කිරීම ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යනාදී කරනු සඳහා අය වැය මගින් ප්‍රතිපාදන වෙන් කරමි එම අරමුණු ඉටු කර ගැනීමට කටයුතු යොදා ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාව සතු වාහන 15 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබා ගත යුතු වේ. | වාහන සඳහා අවශ්‍ය ආදායම් බලපත්‍ර සියල්ල ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) සභාව සතු වාහන 05 ක් රක්ෂණය කර නොතිබුණි. | නියමිත දිනට රක්ෂණ සහතික ලබාගත යුතුවේ. | වාහන සඳහා රක්ෂණ සහතික සියල්ල ලබා ගැනීමට කටයුතු කර ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාවේ තනතුරු 07 ක් සඳහා නිලධාරීන් 08 දෙනෙකු පුරප්පාඩු වී පැවති අතර එම පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර මූල්‍ය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහල නැංවිය යුතු වේ. | පවතින පුරප්පාඩු පිළිබඳ වාර්තාවක් මාස 3 කට වරක් පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කරන අතර එම පුරප්පාඩු හේතුවෙන් සභාවේ දෛනික කටයුතු මඟහැරීමක් සිදුවී ඇත. |
| (ආ) නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු රු.305,790 ක සේවක ණය අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අදාල සේවක ණය අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා පරිශ්‍රයේ ඇති පැරණි L 200 වර්ගයේ කැබ් රථය හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. | වත්කම් හඳුනාගෙන ලේඛන ගත කලයුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවට අයත් රු.16,304,603 ක වටිනා මෝටර් රථ හා යන්ත්‍ර 07 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි ටේලර් 02 ක් අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කලයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ආ) සභාව සතු වටිනාකම රු.490,000 ක් වූ ට්‍රැක්ටර් ටේලර් දෙකක් සහ වතුර බවුසර් දෙකක් ලියාපදිංචි නොකර ධාවනය කරමින් පැවතුනි. | එම වාහන ලියාපදිංචි කර ධාවනයට යෙදවිය යුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.4.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවට අයත් වටිනාකම රු.1,542,228 ක්වූ ගොඩනැඟිල්ලක් සහා වටිනාකම හඳුනාගත නොහැකි ගොඩනැගිලි 03 ක් නිශ්කාර්යව පැවතුණි. | මෙම වත්කම් ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ආ) සභාවට අයත් NCRD – 9442 දරන ට්‍රැක්ටර් රථය සමාලෝචිත වර්ෂයේ මීටර් පැය 1.5 ක් පමණක් ධාවනය කරමින් ඌණ උපයෝජිකව තිබුණි. | මෙම වත්කම් ප්‍රයෝජනවත් කාර්යයේ සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති DMA/2009(1)(i) අංක දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කලයුතු වේ. | ඉදිරිපත් කර නැත |